රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 22/2017 (I)

මගේ අංකය: EST/06/OFTIM/07/1011
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2017.11.01

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>බත්තරමුල්ල ප්‍රදේශයේ රජයේ කාර්යාලවල නම්‍යශීලී කාර්යාල වේලාවන් ක්‍රියාත්මක කිරීමේ නියමු ව්‍යාපෘතිය</u>**

ඉහත මැයෙන් නිකුත් කර ඇති 2017.09.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/2017 කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. එකී චක්‍රලේඛයේ 02 ඡේදයේ V අනු ඡේදය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

V. නම්‍යශීලී කාර්යාල වේලාව ලෙස සාමාන්‍ය කාර්යාල වේලාව නොවන කාර්යාල වේලාවක් තෝරාගත් නිලධරයන්ට තමන් එකඟ වූ පැමිණීමේ වෙලාවෙන් පසුව උපරිමය විනාඩි 30ක් දක්වා පෙ.ව. 9.15 තෙක් වන ප්‍රමාදවීම් ආවරණය කළ හැක. එසේ වුවද ඔවුනට නම්‍යශීලි කාර්යාල වේලාව ක්‍රියාත්මක වන කාල සීමාව තුළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මඟින් විධිවිධාන සලසා ඇති රාජකාරියට පැමිණීම හා පිටවීම සම්බන්ධයෙන් ලබා දී ඇති වෙනත් සහන කිසිවක් ලබා නොදිය යුතුය.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය